# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2060/29 - 2018 මාර්තු මස 02 වැනි සිකුරාදා - 2018.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ (2) අනු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් වර්ෂ 2016 මාර්තු මස 03 දිනැති ජනාධිපති විධානය මගින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව පිහිටුවනු ලැබූ හෙයින් ද,

එකී කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ කාර්යයන් හා වගකීම් සපුරාලීම සඳහා ලබා දී ඇති කාලය 2018 මාර්තු මස 02 වන දිනෙන් අවසන් වන හෙයින් ද,

තවද, එම කොමිෂන් සභාව තවදුරටත් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, උක්ත කොමිෂන් සභාවේ කාර්යයන් හා වගකීම් ඉටුකරලනු පිණිස ලබා දී ඇති කාලය, 2018.03.03 දින සිට තවත් වසර දෙකකින් දීර්ඝ කරමි.

වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 28 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
*වැඩ බලන ජනාධිපති ලේකම්.*

03 - 722

1A - G 27226 — 22 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*